පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 8 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- නාට්‍ය හා රංගකලාව

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................

## පිළිතුරු පත්‍රය

### I කොටස

1. 2
2. 3
3. 1
4. 4
5. 4
6. 2
7. 1
8. 4
9. 2
10. 3
11. ( ✓ )
12. ( X )
13. ( X )
14. ( ✓ )
15. ( X )
16. බැහැරින් ගෙන එන දේ
17. සදාචාර සම්පන්න
18. වර්ණ විනිවිදක
19. සවේෂ පුහුණුව
20. හින්දු ආගම

(ලකුණු : 2 X 20 =40)

### II කොටස

01.

I. ඩී. කුමාරගේ (ල : 02)

II. මී මැස්සෝ (ල : 02)

III. මාෂා විසින් / මී වද පෙට්ටියේ සිට. (ල : 02)

IV. මේසය, පැද්දෙන පුටුව, ඇද, මී වද, මල් පෝච්චිය, මල් කොළ රටා ඇති මේස රෙද්ද (ල : 02)

V. ආච්චි මී වද කෑමට ප්‍රිය කරන බවත් ආච්චිට මී වද ටිකක් ගිහින් දීමට වලහා කැමති කර ගැනීම. (ල : 02)

VI.

- සතුන් ගැන දැන ගැනීම.
- සතුන්ට හිංසා නොකිරීම.
- පරිසරය පිළිබඳ ඉගෙනීම.
- ගෙදර වැඩ ඉගෙනීම.
- වැඩිහිටියන්ට කීකරු වීම. (ල : 02)

ආදී පිළිතුරු වලින් 02ක් ඇත්නම් ලකුණු දෙන්න.

02.

I. යම් කෙනෙකුගේ අත්දැකීමක් රංග ගත කිරීම සඳහා රචනා කරනු ලබන සාහිත්‍යමය / ලිඛිතමය කොටස නාට්‍ය පෙළ ය. (ල : 02)

II.

- නාට්‍යෝචිත අවස්ථා
- ගැටුම ප්‍රධාන කරගත් නාට්‍යමය අවස්ථා
- දෙබස්, සංවාද, ගීත
- රංග විධාන
- චරිත
- අංක හෝ ජවනිකා (ල : 04)

මේවායින් 04ක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.

III. සිසුවා විසින් සඳහන් කර ඇති තේමා සඳහා ලකුණු ලබා දෙන්න. (ල : 06)

03.

I. නළු නිළියන් රංගනය සඳහා තම ශාරීරික හා මානසික සමබරතාවය රැක ගැනීම සඳහා ප්‍රායෝගිකව කරනු ලබන අභ්‍යාස යි. (ල : 02)

II.

- ශාරීරික හා මානසික සැහැල්ලුව හා සමබරතාවය.
- සබකෝලය දුරු වීම.
- ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව.
- පරිකල්පන ශක්තිය වර්ධනය වේ.
- නායකත්වයට ගරු කිරීම.
- සාමුහිකව කටයුතු කිරීමේ හැකියාව.
- පුද්ගල පෞරුෂය දියුණු කර ගැනීම.
- පැහැදිලි කටහඬක් ලබා ගත හැකි වීම. (ල : 04)

ආදීය ඇත්නම් ලකුණු ලබා දෙන්න.

III. සිසුවා ලියා ඇති පිළිතුරට අදාලව ලකුණු ලබා දෙන්න. (ල : 06)

04.

I. සිරිත් මල්දම (ල : 02)

II. සිසුවා ලියා ඇති පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (ල : 04)

III. සිසුවා ලියා ඇති පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (ල : 06)

05.

I. අභි + නය = අභිනය - වෙතට පැමිණ වීම, ඉදිරියට ගෙන එම.

ආදී ලෙස සටහන්ව තිබිය යුතු ය. (ල : 02)

II. ආංගික අභිනය - අත පය චලනයන් මගින් අදහස් ප්‍රකාශ කිරිම.
වාචික අභිනය - වචන මගින් අදහස් ප්‍රකාශ කිරිම.
සාත්වික අභිනය - මුහුනේ හැගිම් ඉරියව් මගින් අදහස් ප්‍රකාශ කිරිම.
ආහාර්ය අභිනය - වේදිකාවට බැහැරින් ගෙන එනු ලබන සියලු දේ.

ආදී ලෙස සටහන් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල : 04)

III. ආනුශංගික කලාවන්ගෙන් සිසුවා නම් කර ඇති ඕනෑම කලාවකට අදාල පිළිතුරු ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල : 06)

06.

I. නළුවා හෝ නිළිය තමන්ගේ පෞද්ගලිකත්වයෙන් බැහැර වී වෙනත් චරිතයකට පැමිණිම සමාරෝපය වේ. (ල : 02)

II. 02කි.

1. අභ්‍යන්තර සමාරෝපය
2. බාහිර සමාරෝපය

අභ්‍යන්තර සමාරෝපය - චරිතයේ ගුණාංග, ලක්ෂණ, හැසිරිමේ රටා, සිතුම් පැතුම්, කතා විලාශය ආදිය පිටපත ඇසුරින් අධ්‍යනය කර එය තමන්ගේ චරිතයට අරෝපණය කර ගැනීම අභ්‍යන්තර සමාරෝපය යි.

බාහිර සමාරෝපය - ආංගික, වාචික, සාත්වික අභිනයන් තීව්‍ර කර දැක්විමට උපකාර වන වේෂ භූෂණ, අංගරචනය, නාට්‍ය පසුතල, රංගාලෝකය, නාට්‍ය උපකරණ ආදිය බාහිර සමාරෝපය වේ.

ආදී ලෙස විස්තර කර ඇත්නම් ලකුණු දෙන්න. (ල : 04)

III.

- නළුවා රගපෑමට පෙර නාට්‍ය පෙළ හොදින් අධ්‍යනය කළ යුතු ය.
- අධ්‍යක්ෂකගේ මග පෙන්විම මත නාට්‍යයේ ශෛලිය හා රිද්මය වටහා ගත යුතු ය.
- තම චරිතය හා අනෙක් නළු චරිත පිළිබඳ අවබෝධයක් තිබිය යුතු ය.
- ප්‍රබල කටහඬක් ගොඩනගා සිටිය යුතු ය.
- රංග ශිල්ප, ක්‍රම උපායන් ගැන දැන සිටිය යුතු ය.

ආදී ලෙස පිළිතුරු ඇත්නම් ලකුනු දෙන්න. (ල : 06)

07. සිසුවා ලියා ඇති පිටපතට අදාලව ලකුණු ලබා දෙන්න. (ල : 06)